ඇඹිලිපිටිය කලාපය

දෙවන වාරය පාඩම් මාලාව-2020

සිංහල භාෂාව හා සාහිත්‍යය-8 ශ්‍රේණිය

09.අවුරුදු සිහිනය-පස්වන පාඩම

- කෙටිකතා සම්බන්ධව මූලික දැනුමක් ඇති ඔබ මේ වනවිට ඕනෑම කෙටිකතාවක් කියවා එයින් ප්‍රකාශවන ජීවන දෘෂ්ටිය හඳුනාගතහැකි ශිෂ්‍යයෙකි.
- කෙටිකතාකරුවා ජීවිතය පිළිබඳ හෙළා ඇති දැෂ්ටිය හෙවත් ඔහු ජීවිතය දකින ආකාරය කෙටිකතාවේ ජීවන දෘෂ්ටිය යනුවෙන් හැඳින්වේ.
- තමා තෝරාගෙන ඇති තේමාව කියවන්නාට සත්‍ය සේ හැඟීයන පරිදි මනා පරිස්සමින් නිර්මාණශීලීව ගොඩනැඟිය යුතුය.
- අවස්ථා හා සිද්ධි නිරූපණයේදී එකකට එකක් පරස්පර නොවන ආකාරයෙන් හේතුඵල සම්බන්ධතාවයෙන් ගොඩනැගී තිබිය යුතුය.මෙවන් කෙටිකතා බිහිකළ කෙටිකතාකරුවන් රාශියකි.

පහත ක්‍රියාකාරකම්හි නිතර නිරතවන්න.

1. මාර්ටින් වික්‍රමසිංහ, කේ.ජයතිලක, එදිරිවීර සරත්චන්ද්‍ර, ගුණදාස අමරසේකර, ජී.බී.සේනානායක, දයාසේන ගුණසිංහ, සයිමන් නවගත්තේගම වැනි දේශීය කෙටිකතාකරුවන්ගේ කෙටිකතා සොයා කියවන්න.
2. අර්නස්ට් හෙමිංවේ, ජෝසප් එසන්වීන්, ඇන්ටන් චෙකෝෆ්, ගීද මෝපසාං, සමර්සෙට් මෝම්, මක්සිම් ගෝර්කි, ආර්.කේ.නාරායන් වැනි විදෙස් කෙටිකතාකරුවන්ගේ කෙටිකතා සොයා කියවන්න.

- "අපටත් දවසක ඉර පායා දෝ" කෙටිකතාව ඒ.වී. සුරවීර මහතාගේ නිර්මාණයකි. මෙහි චරිත හා සිදුවීම් කෙතරම් අප අවට ජීවත්වන චරිත හා සිදුවීම් සමඟ ගැළපේදැයි එය කියවීමෙන්ම අවබෝධ වේ. සාර්ථක කෙටිකතා ලක්ෂණවලින් යුතු එය කියවීමෙන් ඔබට කෙටිකතාවක ඇති රසය මනාව වැටහෙනු ඇත..

පැවරුම්

1. පෙළපොතේ ප්‍රායෝගික අභ්‍යාසයන්හි නිරතවන්න.
2. වෙසක් පහන කෙටිකතාව කියවන්න.